# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2086/39 – 2018 අගෝස්තු 31 වැනි සිකුරාදා – 2018.08.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැල්ලබඩ පත්තුව සුළු කොට්ඨාසයේ, සුදුවැල්ල ගමේ පිහිටි, සර්වේයර් ජනරාල්ගේ අංක එම්ආර්/ඩීකේඩබ්ලිව්/2015/452 හා 2016.01.20 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණවලින් යුත් ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර 'සී' – ගෙදරවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0031**

උතුරට: මු.පි. මාර 2529හි කැබලි අංක 48, මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර ඒ, බී, මු.පි. මාර 2529හි කැබලි අංක 49 සහ මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර ඩී; නැගෙනහිරට: කැබලි අක්ෂර ඩී; දකුණට: එස්. එච්. රංජන් සිල්වා හිමිකම් කියන ගෙදර වත්ත; බටහිරට: එස්. එච්. රංජන් සිල්වා හිමිකම් කියන ගෙදර වත්ත සහ එස්. එච්. ගුණවර්ධන හිමිකම් කියන ගොඩැල්ල අද්දරවත්ත.

02. **කැබලි අක්ෂර 'ඩී' – ප්‍රමාණය: හෙක්. 0.0033**

උතුරට: කැබලි අක්ෂර බී, මු.පි. මාර 2529හි කැබලි අංක 49 සහ කැබලි අංක නොයෙදූ මාර්ගය; නැගෙනහිරට: මු.පි. මාර 2529හි කැබලි අංක 52; දකුණට: මු.පි. මාර 2529හි කැබලි අංක 52 සහ එස්. එච්. රංජන් සිල්වා හිමිකම් කියන ගෙදර වත්ත; බටහිරට: එස්. එච්. රංජන් සිල්වා හිමිකම් කියන ගෙදර වත්ත සහ කැබලි අක්ෂර සී.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

යොමු අංකය: 4-3/16/2013/එල්එච්/50.
2018 ජූනි මස 08 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

09 – 404


1A – G28385 – 12 (2018/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.


*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*